# ගිණුම්කරණ ක්‍රියාවලිය - පියවර 04
# (ගනුදෙනු සාරාංශ කිරීම)

රුක්මල් විජේකෝන්

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972


JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

# ගිණුම්කරණ ක්‍රියාවලිය - පියවර 04 (ගණුදෙණු සාරාංශ කිරීම)

## ශේෂ පිරික්ෂුම (The Trial Balance)

ශේෂ පිරික්ෂුම යනු යම් නිශ්චිත අවස්ථාවක ලෙජර ගිණුම් සියල්ලේම අවසාන ශේෂ දක්වමින් පිළියෙල කරනු ලබන ශේෂ ලැයිස්තුවකි. මෙය ගිණුමක් නොවේ. ශේෂ ලැයිස්තුවකි. ලෙජර් ගිණුම් වලට අදාළ හර ශේෂයන් හා බැර ශේෂයන් දැක්වීමට වෙනම තීරු 2 ක් හා ගිණුමේ නම ලිවීමට විස්තර තීරුවක් ද සහිතව මෙය පිළියෙල කරන අතර අදාළ ගිණුම ඇත්තේ ලෙජරයේ කවර පිටුවේ ද යන්න දැක්වීමට ''ලෙජර පිටුව'' නමින් තීරුවක් ද ඇත. සරල ආකෘතියක් පහත දැක්වේ.

### ශේෂ පිරික්ෂුම

| දිනය | විස්තරය | ලෙ. පි. | හර | බැර |
|---|---|---|---|---|
| | වත්කම් | | xxx | |
| | වියදම් | | xxx | |
| | වගකීම් | | | xxx |
| | ආදායම් | | | xxx |
| | හිමිකම් | | | xxx |
| | | | xxx | xxx |

ලෙජර් ගිණුම් පිළියෙල කරනුයේ ද්විත්ව සටහන් මූලධර්මය අනුව බැවින් ශේෂ පිරික්සුමක හර තීරුවේ එකතුව බැර තීරුවේ එකතුවට සමාන විය යුතුය. එසේ නොවුනහොත් ගිණුම් තැබීමේ වරදක් හෝ ශේෂ පිරික්ෂුම උපුටා ගැනීමේ දෝෂයක් ඇති බව හෙළි කරයි.

### ශේෂ පිරික්ෂුමක අභිමතාර්ථ

### (The Objectives of the Trial Balance)

1. ගිණුම්වල අංක ගණිතමය නිවැරදිතාවය තහවුරු කර ගැනීම.
2. අවසාන ගිණුම් සකස් කිරීමට හැකිවන පරිදි සාරාංශයක් පිළියෙල කිරීම.

ශේෂ පිරික්සුම සමාන විය යුතුය. සමාන නොවේනම් එයින් පැහැදිලි වන්නේ ලෙජර් ගිණුම්වල දෝෂයක් ඇති බවයි. එහෙත් ශේෂ පිරික්සුමක් සමාන වූ පමණින්ම ලෙජරයේ ඇතුළත් සටහන් 100% නිවැරදි යැයි නිගමනය කළ නොහැක. මෙයින් ගම්‍ය වන්නේ ලෙජරයේ වැරදි තිබුණ ද ශේෂ පිරික්ෂුම ඇතැම්විට එකඟ විය හැකි බවයි. එයට හේතුව ශේෂ පිරික්ෂුමෙන් අනාවරණය නොවන දෝෂ තිබිය හැක.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

## උදාහරණ

මහේෂ් 100,000/= ප්‍රාග්ධනය ලෙස යොදා 2019.01.01 දින ව්‍යාපාරයක් ආරම්භ කලා.

| | | |
|---|---|---|
| ජන: 1 | 15,000/= බඩු අත්පිට ගත්තා. | |
| ජන: 2 | 7,000/= යන්ත්‍රයක් ගත්තා | |
| ජන: 3 | ගෙවල් කුලී ගෙව්වා 700/= | |
| ජන: 4 | **<u>ණයට ගැණුම්</u>** | |
| | සිල්වාගෙන් | 15,000/= |
| | පෙරේරාගෙන් | 7,000/= |
| | පාලගෙන් | 8,000/= |
| ජන: 6 | විදුලිය ගෙව්වා | 500/= |
| ජන: 7 | රක්ෂණ | 300/= |
| ජන: 8 | අත්පිට විකුණුම් | 2,000/= |
| ජන: 9 | **<u>ණයට විකුණුම්</u>** | |
| | අනුරට | 2,000/= |
| | සමන්ට | 3,000/= |
| | රංජිත්ට | 2,000/= |
| ජන: 10 | **<u>ආපසු යැවුම්</u>** | |
| | සිල්වාට | 1,500/= |
| | පෙරේරාට | 1,000/= |
| ජන: 11 | ගෙවල් කුලී ගෙව්වා | 2,000/= |
| ජන: 12 | **<u>ආපසු එවුම්</u>** | |
| | අනුර | 500/= |
| | සමන් | 800/= |
| ජන: 13 | ලීබඩු ගත්තා | 3,000/= |
| ජන: 14 | අත්පිට විකුණුම් | 1,000/= |

පහත දෑ පිලියෙළ කරන්න.

1. උපයෝගී පොත් පිළියෙල කරන්න.
2. ලෙජරයේ ගිණුම් පිළියෙල කරන්න.
3. ශේෂ පිරික්සුම පිළියෙල කරන්න.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

## උදාහරණ

සතිස්ගේ ව්‍යාපාරයේ 2019/12/31 දිනට පහත සඳහන් තොරතුරු සපයා ඇත.

| | | |
|---|---|---|
| | ඉඩම් ගොඩනැගිලි | 150,000/= |
| | යන්ත්‍ර | 60,000/= |
| | ලීබඩු | 20,000/= |
| | ණයගැතියෝ | 5,000/= |
| | බඩුතොගය | 3.000/= |
| | ණයහිමියෝ | 4,000/= |
| | උපචිත වියදම් | 2,000/= |
| | මුදල් | 3,000/= |
| ජන: 1 | අතිරේක ප්‍රාග්ධනය යෙදුවා | 25,000/= |
| ජන: 2 | අත්පිට ගැණුම් | 2,000/= |
| ජන: 3 | **ණයට ගැණුම්** | |
| | ප්‍රියන්තගෙන් | 7,000/= |
| | ජයන්තගෙන් | 3,000/= |
| | සුගත්ගෙන් | 4,000/= |
| ජන: 4 | ගෙවල් කුලී ගෙව්වා | 1,000/= |
| ජන: 5 | **ආපසු යැවුම්** | |
| | ප්‍රියන්තට | 500/= |
| | ජයන්තට | 700/= |
| | සුගත්ට 400/= | |
| ජන: 6 | අත්පිට විකුණුම් | 1,000/= |
| ජන: 7 | රකෂණ | 500/= |
| ජන: 8 | **ණයට විකුණුම්** | |
| | වසන්තට | 1,000/= |
| | සුසන්තට | 1,500/= |
| ජන: 9 | **විදුලි ගෙව්වා** | 1,200/= |

පහත දෑ පිලියෙළ කරන්න.

1. උපයෝගි පොත
2. ලෙජරයේ ගිණුම්
3. ශේෂ පිරික්සුම පිළියෙල කරන්න.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

## උදාහරණ

මහානාම විසින් 2019/09/01 දින වෙළඳ ව්‍යාපාරයක් (සිල්ලර) ඇරඹීය. පළමු මාසය තුළ සිදුවූ ගණුදෙනු පහත පරිදි වේ.

2019 සැප්.

1. ප්‍රාග්ධනය වශයෙන් රු. 100,000/- යෙදවීම.
2. රු. 500,000/- බැංකුවේ තැන්පත් කර ජංගම ගිණුමක් විවෘත කරන ලදී.
3. රු. 100,000/- චෙක් පතක් දී ව්‍යාපාරයට යන්ත්‍රයක් මිලදී ගන්නා ලදී.
4. සිල්ලර බඩු අත්පිට ගැණුම් රුː 100,000/- කි.චෙක්පතකින් ගෙවීම් කරන ලදී.
5. සංජීවට ණයට විකුණුම්
   - සහල් 1kg ක් රුː 60/- බැගින් 10kg.
   - සීනි 1kg ක් රු. 64/- බැගින් 5kg.
   - පිටි 1kg ක් රු. 60/- බැගින් 5kg.
   - මිරිස් 10kg ක් රු. 240/- බැගින් 1kg.
6. සේවක වැටුප් ගෙවුවා රුː 20,000/-
7. ගොඩනැගිලි කුලී ගෙවුවා රුː 50,000/-
8. ණයට ගැණුම් තරංගගෙන්
   - සහල් 1kg ක් රු. 60 බැගින් 50kg ගෝනි 2 ක්.
   - සීනි 1kg ක් රු. 60 බැගින් 60kg.
   - පිටි 1kg ක් රු. 60 බැගින් කිලෝ 50 ගෝනි 2
   - ලද වෙළඳ වට්ටම 5%
9. සංජීව විසින් හරවා එවුම්
   - මිරිස් 5kg ක් (බොල් මිරිස් තිබීම)
10. අත්පිට විකුණුම් රු.135,000/-කි. ඉන් රු.100,000/-ලැබුනේ චෙක්පතකිනි.
11. තරංගට හරවා යැවුම්
    - සීනි 20kg ක් (ජලය මිශ්‍ර වී තිබීම)
12. රුː 7,500/- පියවීමට තරංගට රු. 6,000/- ක චෙක්පතක් නිකුත් කළා.
13. රුː 5,000/- සුළු මුදල් භාරකරුට ලබා දුන්නා.
14. සංජීවගෙන් ලැබිය යුතු මුදල 10% ක වට්ටමකට යටත්ව චෙක්පතකින් ලැබුණා.
15. ලද සියළු චෙක්පත් බැංකු ගත කළා.
16. දුරකථන ගාස්තු රු. 9,000/- ගෙවීමට චෙක්පතක් නිකුත් කළා.
17. සුළු මුදල් භාරකරු පහත වියදම් සඳහා අදාළ ලියවිලි ප්‍රධාන මුදල් භාරකරුට ඉදිරිපත් කළා.
    - ගමන් වියදම් රු. 2,500/-

JMC vLearning
© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

- තැපැල් වියදම් රු. 500/-
- සංග්‍රහ වියදම් රු. 500/-
- විවිධ වියදම් රු. 1,000/-

18. සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය කළා.

පහත දෑ පිලියෙළ කරන්න.

1. සියලුම මූලික පොත්
2. ගණුදෙනු ලෙජරයට පිටපත් කරන්න.
3. ශේෂ පිරික්සුම පිළියෙල කරන්න.

JMC vLearning "your virtual learning partner"


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd